# 4 ප්‍රායෝගික ලේඛන - I

## ආකෘති පත්‍ර පිරවීම

එදිනෙදා ජීවිතයේ දී විවිධ කාර්යයන් කර ගැනීමේ දී අපට විවිධ ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමට සිදු වේ. මේ පාඩමේ දී ඉල්ලුම් පත්‍ර පිරවීම සම්බන්ධ ව කරුණු ඉදිරිපත් කෙරෙයි.

පහත දැක්වෙන්නේ බිබිලෙආර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන සුනිල් හපුතන්ත්‍රී මහතා සහ බිබිලෙආර මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුවරයකු වන ප්‍රණීත් විජයසිංහ මහතා අතර ඇති වූ කතාබහකි.

| | |
|---|---|
| **සුනිල්** | ආ ප්‍රණීත් මහත්තයා හුඟ දවසකින් මුණ ගැසුණේ. |
| **ප්‍රණීත්** | ඔව් ඔව් මේ දවස්වල මං අපේ ලොකු පුතාට රස්සාවක් හොයලා දෙන්න එහෙ මෙහෙ යනවා. |
| **සුනිල්** | පුතාගේ ඉගෙනීම කොහොම ද? |
| **ප්‍රණීත්** | පුතා සාමාන්‍ය පෙළ විභාගය සමත් වුණා. උසස් පෙළ විභාගය කලා අංශයෙන් කරලා වැඩ දෙකක් සමත් වුණා. |
| **සුනිල්** | විශේෂ සුදුසුකම් එහෙම මොනවත් තියෙනව ද? |
| **ප්‍රණීත්** | ඔව්. ඉංග්‍රීසි ඩිප්ලෝමා විභාගයකින් සමත් වෙලා තියෙනවා. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉංග්‍රීසිවලට සම්මානයක් තියෙනවා. ඊට අමතරව පරිගණක පාඨමාලාවක් හදාරලා තියෙනවා. |
| **සුනිල්** | පුතා කොහේ ද ඉස්කෝලෙ ගියේ ? |
| **ප්‍රණීත්** | සල්මල්තැන්න මහා විද්‍යාලයට |
| **සුනිල්** | වෙනත් සුදුසුකම් මොනව ද තියෙන්නේ. |
| **ප්‍රණීත්** | ක්‍රීඩාවලින් ඉහළ ම සුදුසුකම් තියෙනවා. පළාත් තරගයක දී මීටර් සියය පළමුතැන ලැබුවා. පාසලේ ශිෂ්‍යභට කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළා. |

| | |
|---|---|
| **සුනිල්** | පුතාගේ නම මොකක් ද? |
| **ප්‍රණීත්** | ජයසංඛ විජයසිංහ |
| **සුනිල්** | ඉපදුණේ මොන අවුරුද්දේ ද? |
| **ප්‍රණීත්** | ඉපදුණේ 1985 ඔක්තෝබර් මාසයේ 03 වැනි දා |
| **සුනිල්** | එතකොට පදිංචිය? |
| **ප්‍රණීත්** | අංක 35, බිබිලෙආර, සල්මල්තැන්න |
| **සුනිල්** | හොඳයි ප්‍රණීත් මහත්තයා, මම උත්සාහ කරලා බලන්නම්. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ලැබෙන පුරප්පාඩු පිළිබඳ ව විස්තර දන්වලා එවන්න. මේ ඉල්ලුම් පත්‍රය පුරවලා දෙන්න. |
| **ප්‍රණීත්** | බොහොම ස්තුතියි. මම ගිහින් එන්නම්. |
| **සුනිල්** | හොඳයි, ගිහින් එන්න. අපි උත්සාහ කරලා බලමු. |

## ක්‍රියාකාරකම්

පහත සඳහන් ඉල්ලුම්පත්වල ආකෘති පත්‍ර සොයා ගෙන ඒවා පුරවන්න.

1. තැපැල් හැඳුනුම්පතක් ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය
2. ගැසට් පත්‍රයේ දැක්වෙන රැකියා ඉල්ලුම් පත්‍ර
3. මාර්ග වාර ප්‍රවේශපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කරන ඉල්ලුම් පත්‍රය

**පැවරුම්:**

1. රජයේ රැකියාවක් ලබා ගැනීම සඳහා ඔබේ ජීව දත්ත (පෞද්ගලික විස්තර) ඇතුළත් කොට ඉල්ලුම් පත්‍රයක් පිළියෙල කරන්න.